**ගාල්ල මහා නගර සභාව - 2023**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ගාල්ල මහා නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක් වේ.

මාගේ වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ගාල්ල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නිකුත් කරන ලද රු.3,947,236 ක් වූ ගබඩා තොග, රු.3,473,201 ක් වූ ඉතිරි ඩීසල් තොගය හා රු.110,300,273 ක විශ්‍රාම වැටුප් දායකය ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව හා විශ්‍රාම වැටුප් දායක මුදල සකස් වී ඇති ආකාරය හඳුනා ගැනීමට කමිටුවක් පත්කර ඇති බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ලැබිය යුතු ආදායම් ණයගැති රු.6,270,246 ක්, ලැබිය යුතු කර්මාන්ත ණයගැති රු.11,663,725 ක් හා ලැබිය යුතු වැටුප් රහිත නිවාඩු රු.642,747 ක් ගිණුම් ගතකර නොතිබුණි. | උසාවි දඩ ලෙස ආදායම් ලැබීමේ දී වර්ගීකරණයක් නොලැබෙන නිසා හඳුනාගත නොහැකි බව හා අනෙක්වා ඉදිරියේ දී නිවැරදි කරන බව. | - එම - |
| (ඇ) | මෘදුකාංගයේ වටිනාකම රු.455,000 ක් හා රු.220,000,000ක පිරිවැයක් දරමින් සභාවට ලබා දී තිබුණු කවිෂිමා කොම්පෝස්ට් යන්ත්‍රයේ වටිනාකම හඳුනාගෙන ගිණුම් ගතකර නොතිබුණි. | මෘදුකාංගයේ වටිනාකම ඉදිරියේදී නිවැරදිව ගිණුම්ගත කරන බව හා කවෂිමා යන්ත්‍රයේ පිරිවැය ලේඛනගතව ලැබුණු බවට සාක්ෂියක් ආයතනය තුළ නොපවතින බව. | - එම - |
| (ඈ) | කසළ එක්රැස්කිරීම වෙනුවෙන් ගෙවිය යුතු රු.1,971,918 ක්, ලැබිය යුතු කසළ බදු ආදායම රු.356,401 ක් හා ලැබියයුතු දඩ ගාස්තු රු.34,826 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | - එම - |
| (ඉ) | ඉදිකිරීමේ කර්මාන්ත 14 ක් වෙනුවෙන් ගෙවිය යුතු රු.3,027,305 ක් හා ස්ථාවර තැන්පතු වෙනුවෙන් ලැබිය යුතු පොලී ආදායම රු.182,057 කින් වැඩියෙන් දැක්වුණි. | - එම - | - එම - |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ බදු මුදල් හා දඩ ගාස්තු රු.10,103,230 ක් වැඩියෙන් ද, 2021 හා 2022 වර්ෂය සඳහා ලද මුද්දර ගාස්තු හා උසාවි දඩ රු.214,662 ක් හා සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු හා උසාවි දඩ රු.24,748,816 ක් හා ලද පොලිය රු.108,819 ක් අඩුවෙන් ද ගිණුම් ගතකර තිබුණි. | නිරීක්ෂණය පිළිගන්නා බව හා ඉදිරියේ දී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුය |
| (උ) | සමාලෝචිත වර්ෂයේ ආරම්භයට සභාව සතු රු.169,078 ක් වටිනා ඖෂධ තොගය සමුච්චිත අරමුදලට හර කිරීම නිසා එම ප්‍රමාණයෙන් වියදම හා සමුච්චිත අරමුදල අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි. | නිරීක්ෂණය පිළිගන්නා බව. | - එම - |
| (ඌ | ඉන්වෙන්ට්‍රි ස්වරූපයේ භාණ්ඩ වටිනාකම රු.319,899 ක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම් ගතකර තිබුණු අතර, වෙන්දේසි කරන ලද පිරිවැය රු.863,358 ක් වූ උපකරණ හඳුනාගෙන ස්ථාවර වත්කම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉන්වෙන්ට්‍රි තොග හා උපකරණ ඉවත් කර වත්කම් ලේඛන සකස් කිරීමට කටයුතු කරන බව. | - එම - |
| (එ) | පුනරාවර්තන වියදම් වෙනුවෙන් ගෙවිය යුතු රු.3,666,392 ක් අඩුවෙන් ණයහිමි ප්‍රතිපාදන සලසා තිබුණි. | ඉදිරියේ දී නිවැරදි කරන බව. | - එම - |
| (ඒ) | පසුගිය වර්ෂය වෙනුවෙන් අයකළ හිඟ වරිපනම් රු.505,604 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම් ගතකර තිබුණි. | තොරතුරු පසු වර්ෂයට ගිණුම් ගත කළ නොහැකි බව. | - එම - |
| (ඔ) | 2021 වර්ෂයේ හිඟ ආදායම් ලැබීම් 2022 වර්ෂයේ ආදායම් ලෙස ගිණුම් ගත කිරීම ප්‍රවර්ථන වර්ෂයේ දී නිවැරදි කිරීමට අවශ්‍ය නොවන බැවින් රු.1,826,256 ක් බලපත්‍ර ගාස්තු පාලන ගිණුම හර කිරීම හා සමුච්චිත අරමුදලට බැර කිරීම නිසා එම ගිණුම් සමාන අගයෙන් වැඩියෙන් දැක් වුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | - එම - |
| (ඕ) | ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා දී තිබුණු රු.374,250 ක ලැබිය යුතු කර්මාන්ත බදු අනුමැතියකින් තොරව කපා හැරීම නිවැරදි නොකිරීම නිසා ලැබිය යුතු කර්මාන්ත බදු එම ප්‍රමාණයෙන් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි. | දඩ ලෙස ලැබෙන අවස්ථාවේ බිල් කිරීම සිදු වන බව. | - එම - |
| (ක) | දේශීය ණය හා සංවර්ධන අරමුදලින් ලබාගත් ණය මුදලෙන් ගෙවිය යුතු රු.3,638,999 ක මුදල ගිණුම් ගතකර නොතිබුණි. | ණය ගෙවීමට සභා අනුමැතියක් ලැබී නොමැති බව. | - එම - |

| | | | |
|---|---|---|---|
| (ග) | ඉකුත් වර්ෂයේදී සභාවට අයත් එකතු පිරිවැය රු.4,584,070 ක් වටිනා වාහන 18 ක් ඉවත් කර තිබුණු නමුත්, ඒවා ස්ථාවර වත්කම් ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම වාහන ඉවත් කර ලේඛන සකස් කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුය |
| (ජ) | මූල්‍ය ප්‍රකාශන තුල තිබුණු එකිනෙක සමාන වියයුතු ගෙවල් කුලී මුදල් ගිණුම සහ ගෙවල් කුලී තැන්පතු ගිණුමේ ශේෂය අතර රු.2,753,908 ක වෙනසක් පැවතුණි. | 2024 අවසන් ගිණුම මඟින් ගැලපීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුය |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනයන්හි ගිණුම් විෂයයන් 24 කට අදාළ ශේෂයන් සහ ඊට අදාළ ලේඛන හා තහවුරු කිරීම් සමඟ සැසදීමේ දී එකතුවෙහි රු.49,798,380 ක වෙනසක් පැවතුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.3 අවිනිශ්චිත ගිණුම

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| 2003 වර්ෂයේ සිට පැවත එන රු.111,553 ක් වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | කපා හැරීම සඳහා අනුමැතියට යොමුකර ඇති බව. | අවිනිශ්චිත ගිණුම් ශේෂය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| **විෂයය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබූ එකතු වටිනාකම රු.542,948,960 ක් වූ ගිණුම් ශේෂ 11 ක තොරතුරු හා සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය.** | | | |
| (i) මුදල් රෙගුලාසි 104 | වාහන අනතුරු 06ක් සම්බන්ධයෙන් වගකිවයුත්තන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මූලික පරීක්ෂණ ඉටු කිරීමට කටයුතු යොදා ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 316 | සභාව සතු උප පත්‍රිකා පොත් 13243 ක් අනාරක්ෂිතව ගබඩාවේ රඳවා ගබඩා කර තිබුණි. | නියමිත පරිදි පවත්වාගෙන යාමට කටයුතු යොදා ඇති බව. | -එම- |
| (ආ) දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ 2018මැයි 22 දිනැති හා අංක SS 03/12/05/දරන චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේ සභාව සතු වටිනාකම සඳහන් නොකරන ලද වාහන හා යන්ත්‍රෝපකරණ 05 ක් සම්බන්ධයෙන් අපහරණය කිරීමට කටයුතු සිදුකර නොතිබුණි. | අපහරණ කටයුතු ඉදිරියේදී සිදු කිරීමට නියමිත බව. | චක්‍රලේඛ ප්‍රකාරව අපහරණ කටයුතු සිදු කළ යුතුය. |
| (ඉ) 2018 ඔක්තෝබර් 10 දිනැති අංක 0312018 වාහන දරන කළමනාකරණ චක්‍රලේඛය. | සභාව සතු අපහරණය කරන ලද වාහන 08 ක් සම්බන්ධයෙන් ලියාපදිංචිය අවලංගු කිරීමට කටයුතු කර නොතිබුණි. | අවශ්‍ය ලිපි ලේඛන මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට භාර දී ඇති බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම, රු.111,864,059 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.66,596,685 ක් විය.

## 2.2 මූල්‍ය පාලනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු.192,088 ක් වටිනා චෙක්පත් 13 ක් අගරු වී වසර 07 ක සිට වසර 26 ක් අතර කාලයක් ගත වී තිබුණද එම චෙක්පත් අයකර ගැනීම සම්බන්ධයෙන් සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ඉදිරි කටයුතු කමිටු තීරණයක් මත සිදු කරන බව. | කඩිනමින් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 1993 නොවැම්බර් 13 දිනැති නාගරික සංවර්ධන අධිකාරි සභාපතිගේ සැලසුම් චක්‍රලේඛ අංක 15 ප්‍රකාරව විවෘත කල ස්ථාවර තැන්පතු ගිණුමේ රු.18,000,000 ක ශේෂයක් පැවතිය ද එම මුදල් ප්‍රයෝජනයට ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සභාව විසින් ඉදිරිපත් කර නොතිබුණි. | සැලසුම අනුමැතිය සඳහා යොමු කිරීමට අපේක්ෂිත බව. | සැලසුම් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

| ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 172,500,000 | 108,277,586 | 118,312,162 | 220,670,073 | 112,500,000 | 113,645,131 | 88,558,593 | 230,704,649 |
| කුලී | 136,001,000 | 117,417,075 | 88,117,584 | 71,263,943 | 117,882,000 | 58,438,908 | 61,184,509 | 41,964,452 |
| බලපත්‍ර ගාස්තු | 28,529,000 | 29,916,328 | 28,090,072 | 9,496,847 | 33,958,000 | 26,842,014 | 24,761,694 | 7,670,591 |
| වෙනත් ආදායම් | 87,275,000 | 121,817,764 | 125,705,498 | 1,440,468 | 56,596,000 | 131,758,201 | 129,375,318 | 5,328,202 |
| | 424,305,000 | 377,428,753 | 360,225,316 | 302,871,331 | 320,936,000 | 330,684,254 | 303,885,114 | 285,667,894 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂය ආරම්භක දිනට මුළු හිඟ ආදායම රු.285,667,894 ක් වූ අතර, වර්ෂය අවසානයට රු.302,871,331 ක හිඟ ශේෂයක් පැවතුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වරිපනම් ඒකක 26653 කින් හිඟ බදු රු.196,088,134 ක් අයවීමට තිබුණු අතර, ඉන් රු.154,041,757 ක් වූ හිඟ ඒකක 7273 ක් සඳහා පමණක් රතු නිවේදන නිකුත් කර තිබුණි. හිඟ වරිපනම් බදු ශේෂය තුළ වසර 05 කට වඩා වැඩි ඒකක 13552 කින් රු.133,745,845 ක ශේෂයක් හා ඒකක 6812 කින් රු.44,253,279 ක ශේෂයක් වසර 02 ත් 05 ත් අතර කාලයක සිට හිඟව පැවතුණි. එම හිඟ ශේෂ අය කර ගැනීමට මහා නගර සභා ආඥා පනතේ 252(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | රු.5,000 ට වැඩි හිඟ වරිපනම් බදු ශේෂයන් සඳහා රතු නිවේදන නිකුත් කරන ලද බව හා දේපල තහනම් කිරීමේ වැඩසටහන රු.25,000 ට වැඩි දේපල හිඟ සඳහා කටයුතු කිරීමට ද සංවිධානය කරමින් පවතින බව. | -එම- |
| (ඇ) | වර්ෂ 05 කට වරක් තක්සේරුව යාවත්කාලීන විය යුතු වුවද, ගාල්ල ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය 2013 වර්ෂයේ තක්සේරුව මත සමාලෝචිත වර්ෂයේ දී ආදායම් අයකර තිබුණි. | භූමි ප්‍රමාණ නිර්ණය කිරීමෙන් අනතුරුව කඩිනමින් තක්සේරු වාර්තාවක් ලබා ගන්නා බව. | නියමිත ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | DSI ආයතනය වෙත බදු දී තිබු ගොඩනැගිල්ල සහිත ඉඩම 2022 වර්ෂයේදී රු.6,100,000 ක වාර්ෂික බදු මුදලකට තක්සේරු කර තිබු නමුත්, 2023 වර්ෂයේදීත් අයකර තිබුණේ රු .150 ක් වූ මාසික බදු මුදලකි. | ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබීමෙන් අනතුරුව නව තක්සේරුව අනුව 2022 වර්ෂයේ සිට බදු අය කිරීමට නියමිත බව. | ගිවිසුම් අළුත් කිරීම කඩිනම් කළ යුතුය. |
| (ඉ) | සියඹලාගහවත්ත නාගරික නිවාස 10 කට අදාළව රු.800,610 ක හිඟ ශේෂයක් වූ අතර, වසර 07 ත් 17 ත් අතර කාලයක සිට කිසිදු බදු මුදලක් අදාළ පාර්ශවය විසින් සභාව වෙත ගෙවීම් සිදුකර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීම සඳහා ආදායම් පරීක්ෂක වෙත ලිපි යොමුකර ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | ධර්මපාල උද්‍යානයේ A ආපන ශාලාව 2022 වර්ෂයේ දී මාසික කුලිය රු.200,000 ක බදු මුදලකට වර්ෂ දෙකකට බදු දීමට තීරණය කර තිබුණු නමුත් එම තක්සේරු වටිනාකම අවලංගු වන තෙක්ම එය ටෙන්ඩර් කිරීමට කටයුතු කර නොතිබීමෙන් සභාවට රු.4,800,000 ක ආදායමක් අහිමි වී තිබුණි. | තක්සේරු වාර්තාව නොලැබීම මත මිල ගණන් කැඳවීම ප්‍රමාද වී ඇති බව. | සභාව සතු වත්කම්වලින් ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (උ) | නාගරික නව මාළු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 30 ක් තක්සේරු කර සභාව වෙත දන්වා තිබුණ ද, බදු දීමේ කටයුතු සිදු කර නොතිබූ බැවින් සභාවට රු.7,004,400 ක ආදායමක් අහිමි වී තිබුණි. | ඉදිරියේදී ටෙන්ඩර් කිරීමට නියමිත බව. | සභාව සතු වත්කම්වලින් කඩිනමින් ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | සමාලෝචිත වර්ෂය අවසන් දිනට හිඟ කඩ කුලී ශේෂය රු.26,437,920 ක් වූ අතර, ඉන් කඩ කාමර 242 කින් රු.18,423, 763 ක ශේෂයක් වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට අය නොවී පැවතිණි. මහා නගර සභා ආඥා පනතේ 253(1) වගන්තිය ප්‍රකාරව මෙම හිඟ ශේෂ අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් නොගෙවන කඩ කාමර සම්බන්ධයෙන් 9 වන උපලේඛනය නිකුත් කර ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (එ) | සභා බල ප්‍රදේශයේ ප්‍රදර්ශනය කර තිබුණු ස්ථිර දැන්වීම් පුවරු 401 ක් වෙනුවෙන් රු.13,904,589 ක ගාස්තුවක් අයකර නොතිබුණි. | නොගෙවන ලද දැන්වීම් පුවරු සඳහා නඩු පැවරීමට කටයුතු කරමින් පවතින බව. | හිඟ දැන්වීම් පුවරු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඒ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් මුද්දර ගාස්තු වෙනුවෙන් රු.163,855,041 ක් ලැබිය යුතුව තිබුණි. | රු.139,128,124 ක මුදලක් ප්‍රධාන වන අතර, රු.24,726,920 ක අධි ඌණ වෙන් කිරීම් මත ඇති වූ මුදලක් බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයේ ආරම්භ කර තිබූ පිරිවැය රු.මිලියන 220 ක් වූ කොම්පෝස්ට් පොහොර නිෂ්පාදන ව්‍යාපෘතියේ පවතින ගැටළු 07 ක් නිරාකරණය කර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණු අතර මෙහි කසළ මෙ.ටො.6000 කින් නිෂ්පාදනය කල පොහොර ප්‍රමාණය මෙ.ටොන් 05 ක් තරම් අඩු අගයක් ගෙන තිබුණි. එම ව්‍යාපෘතිය සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් පරිසර බලපත්‍රය ද ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ව්‍යාපෘතියේ පවතින අඩුපාඩු නිසා පරිසර බලපත්‍රය ලබා ගැනීමට කටයුතු කළ නොහැකි තත්ත්වයක් පවතින බව. | අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නගර සභා බල ප්‍රදේශය තුළ ඉදිකරන ලද අනවසර ඉදිකිරීම් 09 කට අදාළව රු.4,562,500 ක ගාස්තු අයකර ආවරණ අනුමැතිය ලබා දීමට කටයුතු කර නොතිබුණි. | අනවසර ඉදිකිරීම් නීත්‍යානුකූල කර ගන්නා ලෙස දන්වා යැවීමට කටයුතු කල බව. | ගැසට් පත්‍රය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) 2012 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු රු.994,900 ක් වටිනා ලැප්ටොප් 11 ක් හා රු.395,991 ක් වටිනා ටැබ් 09 ක් සභිකයින්ට ලබාදී තිබුණද නැවත භාරදී නොතිබුණි. | පළාත් පාලන කොමසාරිස් වෙත ලිපියක් ඉදිරිපත් කර ඇති බව. | සභාව සතු වත්කම් කළමනාකරණය සිදුකළ යුතුය. |
| (ඇ) 2012 වර්ෂයේ සිට නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් සභාව වෙත ලැබිය යුතු රු.759,190 ක බදු ආදායමක් වසර 11 ක් තිස්සේ අය නොවී පැවතුණි. | සභාව වෙත කඩිනමින් ගෙවීමට කටයුතු කරන බව දන්වා ඇති බව. | සභාව සතු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගතයුතු ආයතන වලින් බලපත්‍ර ගාස්තු වශයෙන් රු.1,786,500 ක් හා පරීක්ෂණ ගාස්තු වශයෙන් රු.1,191,000 ක් සභාව අය කරගෙන නොතිබුණි. | ඉදිරියේ දී ක්ෂේත්‍ර පරීක්ෂාවක් කරන බව. | චක්‍රලේඛ ප්‍රකාරව පරිසර බලපත්‍ර ලබාදීම සිදු කළ යුතුය. |

## 3.3 මෙහෙයුම් අකායර්ක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රදේශය තුළ බදු හා බලපත්‍ර ගාස්තු ගෙවන ආයතන 236 කින් පමණක් කසළ ගාස්තු රු.11,636,250 ක් අයකර ගෙන තිබුණු නමුත්, අනෙකුත් ආයතන 2931 සම්බන්ධයෙන් සභාවේ අවධානය යොමු වී නොතිබුණි. | අවශ්‍ය කටයුතු සිදු කිරීමට සැලසුම් සකස් කර ඇති බව. | ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) ගොඩනැගිලි 04 ක වාහන නැවතුම් ස්ථාන 47 ක් සඳහා ඉදිකිරීම් අවස්ථාවේ දි ඉඩ වෙන්කර නොතිබුණු බැවින් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ගැසට් පත්‍රයේ අ4.1 ඡේදය යටතේ රු.23,500,000 ක් අයකළ යුතු වුවත්, එසේ කර නොතිබුණි. | පසු විපරමක් හෝ නිරන්තර අධීක්ෂණයක් සිදු නොකරන බව. | ගැසට් පත්‍ර ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.4 මතභේදයට තුඩු දෙන ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහා නගර සභා ආඥා පනතේ (242 අධිකාරියේ) 188(1) වන වගන්තියේ විධිවිධානවලට අනුකූල නොවන අයුරින් 2021 හා 2022 වර්ෂ සඳහා ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලවලින් සභාවට ලැබිය යුතු මුද්දර ගාස්තු රු 38,448,462.ක් අයකර ගැනීම වෙනුවෙන් 2023වර්ෂයේ දී දිරි දීමනා වශයෙන් රු1,153,45.2 ක් ගෙවීම් කර තිබුණි. | නෛතික ප්‍රතිපාදන යටතේ මෙම දිරි දීමනාව ගෙවීම් සිදුකර ඇති බැවින් එය සභා අරමුදලට සිදු කරන ලද පාඩුවක් ලෙස දැක්විය නොහැකි බව. | මහා නගර සභා ආඥා පනත ප්‍රකාරව මුද්දර ගාස්තු සඳහා දීමනා ගෙවීම සහ අරමුදලට සිදු කරන පාඩුවක් බව. |

**3.5 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාහන 19 ක් මාස 06 ක සිට වර්ෂ 10 ක් අතර කාලයක සිට අළුත්වැඩියාව නොකිරීම නිසා සභාව සතු වාහන නිශ්කාර්යව පැවතුණි. | අළුත්වැඩියා කිරීමට කටයුතු කරන බව. | සභාව සතු වත්කම් නිසි පරිදි නඩත්තු කිරීම සිදු කළ යුතුය. |
| (ආ) | සභාව සතු වාහන 108 ක වටිනාකම හඳුනාගත නොහැකි වූ අතර, ඉන් ට්‍රේලර් රථ 08 ක් හඳුනා ගැනීමට නොහැකි පරිදි දිරාපත් වී ගොස් තිබුණ ද, ඒවා අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | වාහන වල වටිනාකම තක්සේරු කිරීම් කටයුතු සිදු කරමින් පවතින බව. | වටිනාකම හඳුනා ගැනීම සහ චක්‍රලේඛ ප්‍රකාරව අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ඉඩම් කොටස් 23 ක් සභාවේ අනුමැතියකින් තොරව පෞද්ගලික පාර්ශවයන් විසින් පරිහරණය කරමින් පැවතුණි. | එම ඉඩම් කොටස් නැවත ලබා ගැනීමට කටයුතු කිරිම සඳහා අවශ්‍ය කරන පියවරයන් ගෙන ඇති බව. | සභාව සතු දේපල ආරක්ෂා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | සභාව සතු ඉඩම් 84 කට අදාළව පිඹුරුපත් සකස් කිරීමට හා ඉඩම් 99 කට අදාළව හිමිකම් ඔප්පු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී කටයුතු කරන බව. | සභාවට අයත් සියළු දේපල සභාව සතුකර තැබිය යුතුය. |

**3.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගාල්ල සමනළ ක්‍රීඩාංගනයේ යෝජිත නවීන වැසිකිළි පද්ධතිය ඉදිකිරීම් කර්මාන්තයේ නිසි පරිදි මුළු පිරිවැය ඇස්තමේන්තුව සකස් නොකිරීම නිසා අමාත්‍යංශයෙන් ප්‍රතිපූර්ණය කරගත හැකිව තිබූ රු.1,235,760 ක් මහා නගර සභා අරමුදලට අහිමි වී තිබුණි. | පිළිතුරු ලබා දී නොමැති බව. | නිසි පරිදි මුළු පිරිවැය ඇස්තමේන්තු සකස් කළ යුතුය. |
| (ආ) | හීන් ඇළ කැකුණගෙවත්ත මාර්ගය තාර යොදා සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ ඉදිකරන ලද ප්‍රමාණ නිසි පරිදි ගණනය නොකිරීම නිසා රු.97,862 ක් වැඩිපුර ගෙවා තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | වැඩිපුර ගෙවීම් අයකළ යුතුය. |
| (ඇ) | දඩල්ල ආදාහනාගාරයේ අංක 03 කුටීරය අලුත්වැඩියා කිරීමේ කර්මාන්තයේ නියමිත පරිදි ඉදිකිරීම් කටයුතු සිදුකර නොතිබියදී කොන්ත්‍රාත්කරුට රු.1,200,000 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණි. | වැඩ විස්තරයේ පැහැදිලිව සඳහන් නැති බව. | නිවැරදිව ඇස්තමේන්තු සකස් කළ යුතුය. |

### 3.7 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂ අවසානය වන විට සභාවේ අයවිය යුතු සේවක ණය ශේෂය රු.81,332,218 ක් වූ අතර එයින් ස්ථාන මාරු වී ගිය, විශ්‍රාම ගිය, වැඩ තහනම් කළ, සේවය හැර ගිය, මිය ගිය, විදෙස් ගත වූ හා වෙනත් සේවකයින් 39 දෙනෙකුගෙන් අය විය යුතු එකතුව රු.3,296,775 ක ණය ශේෂය අය නොවී හිඟව පැවතුණි. | ණය ශේෂ අයකර ගැනීම සම්බන්ධව ඉදිරි කටයුතු ඉටු කරමින් පවතින බව. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | නගර සභා ආඥා පනතේ 183(1) වගන්තිය ප්‍රකාරව සභාවේ සේවකයින් සඳහා පිහිටුවන ලද සේවක අර්ථසාධක සමාජික අරමුදල සඳහා 1999 වර්ෂයට පෙර දායක වූ නගර සභා සේවකයින් වෙනුවෙන් එකතු වූ මුදල 2023 දෙසැම්බර් 31 දිනට රු.16,773,004 ක් වූ එම මුදල් අදාල සේවකයින්ට ගෙවීම් නොකර ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | ඉදිරියේ දී කරුණු සොයා බැලීම් කර නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 තිරසර සංවධර්න අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2030 තිරසර සංවර්ධන සඳහා න්‍යාය පත්‍රයට එකඟ වීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටක් වශයෙන් ශ්‍රී ලංකාව අත්සන් තබා ඇත. එහි අරමුණු 17 ක් ඉලක්ක 169 ක් හා දර්ශක 244 ක් අන්තර්ගත වේ. එම අරමුණු කරා ළඟා වීමේ දී 2030 න්‍යාය පත්‍රයට අනුකූලව සිය විෂය පථය අනුව තිරසර සංවර්ධන අරමුණු ගාල්ල මහා නගර සභාව හඳුනාගෙන නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන ඒවා ළඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. |